# <u>තොරතුරු තාක්ෂණ කවය</u>

## <u>ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - බුලත්සිංහල</u>

## <u>තත්ත්ව කව ව්‍යාපෘතිය</u>

**ව්‍යාපෘතිය** - Face book page එක නිර්මාණය කිරිම .

ප්‍රථම පියවර වශයෙන් වර්තමානයේ කාර්යාලයේ සේවාවවින් සැපයීමේ දී නවීන තාක්ෂණය පිළිබද මතු වී ඇති ගැටළුකාරී තත්ත්වයන් මාසික කව රැස්වීමේ දී කව සාමාජිකයින්ගේ බුද්ධි කලම්භනය තුලින් පහත පරිදි ගැටළු හදුනා ගන්නා ලදී .

**<u>හදුනාගත් ගැටළු -</u>**

01ආයතනයේ සිදු කෙරෙන වැඩසටහන් පිළිබද මහජනතාව දැනුවත් කිරීමේ

ක්‍රමයක් නොමැති වීම .

02. දුරකථන හා කෙටි පණිවිඩ සේවා මගින් අදාළ තොරතුරු නිර්මාණාත්මකව

ඉදිරිපත් කිරිමට නොහැකි වීම .

03. සෑම පුද්ගලයකු ළගම පරිගණකයක් නොමැති වීම .

04 සෑම විටම පරිගණකය අසල රැදී සිටීමට කාලයක් නොමැති වීම .

05. පවතින වෙබ් අඩවි යාවත්කාලීන නොවීම .

06 පරිගණකවල දෝෂ පැවතීම හා විදුලිය බිද වැටීම වැනි අවස්ථාවලදී භාවිතා

කිරීමට නොහැකි වීම.

07. විශාල ප්‍රමාණයකට එකවර පණිවිඩයක් දීමේ දී විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.

**<u>ගැටළු ප්‍රමුඛතාකරණය -</u>**

ගැටළුවේ ස්වභාවය හා එමගින් ඇතිකරන ලද බලපෑමේ ප්‍රමාණාත්මකතාවය සලකා බලා පහත පරිදි එම ගැටළු ප්‍රමුඛතා කරගත් අතර , එම අනුපිළිවෙල අනුව ගැටළු සදහා කවය මගින් විසදුම් ලබා දීමට තීරණය විය .

01ආයතනයේ කෙරෙන වැඩසටහන් පිළිබද මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමයක් නොමැති වීම .

02. විශාල ප්‍රමාණයකට එකවර පණිවිඩයක් දීමේ දී විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.

03. දුරකථන හා කෙටි පණිවිඩ සේවා මගින් අදාළ තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට නොහැකි වීම .

04. සෑම පුද්ගලයකු ළගම පරිගණකයක් නොමැති වීම .

05 සෑම විටම පරිගණනය අසල රැදී සිටීමට කාලයක් නොමැති වීම .

06. පරිගණකවල දෝෂ පැවතීම හා විදුලිය බිද වැටීම වැනි අවස්ථාවලදී භාවිතා කිරීමට නොහැකි වීම.


07. පවතින වෙබ් අඩවි යාවත්කාලීන නොවීම .

**<u>ගැටළු අංක 01</u>**

01ආයතනයේ කෙරෙන වැඩසටහන් පිළිබද මහජනතාව දැනුවත් කිරිමේ ක්‍රමයක් නොමැති වීම .

## ගැටළු විශ්ලේෂණය කිරීම

හේතුඵල සටහන ( මාළු කටු න්‍යාය ) අනුව මෙම ගැටළුව පහත පරිදි විශ්ලේෂණය කර ගන්නා ලදී.



**විසඳුම් ජනනය**

ගැටළුව විශ්ලේෂණය කර හඳුනාගත් හේතූන් ලෙස කව සාමාජිකයින් විසින් පහත සඳහන් විසඳුම් මේ සඳහා යෝජනා කරන ලදී .

DS bulathsinhala face book page එක නිර්මාණය කිරීම .

කෙටි පණිවිඩ සේවාව මගින් තොරතුරු ලබා ගැනීම .

අන්තර් ජාලය භාවිතය

තැපැල් මගින්

දැන්වීම් මගින් තොරතුරු හුවමාරුව

විවිධ වූ මාධ්‍ය මගින්

**විසඳුම් තෝරා ගැනීම**

ඉහත යෝජිත විසඳුම් අතුරින් කාර්යාලීය තොරතුරු හුවමාරුව වඩා විධිමත් අයුරින් හා රූපරාමු සහිතව අභ්‍යන්තර හා බාහිර පාර්ශව වෙත තොරතුරු සන්නිවේදනය කිරීමේ ක්‍රමයක් ලෙස ෆේස් බුක් පේජ් (face book ) එක නිර්මාණය කිරීමට තීරණය විය .

**එම විසඳුම් තෝරා ගැනීමට බලපෑ සාධක**

- කල වැඩ හා ඉදිරි වැඩ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම .
- එකවර විශාල පිරිසකට පණිවිඩයක් ලබාදීමට හැකි වීම .
- ඕනෑම පුද්ගලයකුට තොරතුරු ලබා දීමට හැකි වීම .
- රූප රාමු සහිත වීම නිසා අදාල තොරතුරු වල නිවරද්‍යභාවය තහවුරු වීම .

- වර්තමානය වන විට බොහෝදෙනෙක් ෆේස් බුක් ක්‍රමය මගින් තොරතුරු ලබා ගැනීමට පුරුදු වී සිටීම .
- අදාළ තොරතුරු භාගත කර තැබීමෙන් පසුව වුවද භාවිතයට ගත හැකි වීම .
- පාසැල් දරුවන්ට වුවද අදාළ ප්‍රදේශයන්හි සංස්කෘතික තොරතුරු ලබා ගත හැකිවීම .

**Plan**

- E කවයේ සාමාජිකයින් විසින් කව රැස්වීමේ දී තීරණය කරන ලදී.
- Face book page එකට නම් කිහිපයක් යෝජනා වූ අතර ඉන් DS bulathsinhala නම සුදුසු යැයි යෝජනා විය.
- කව සාමාජිකයින්ගේ තීරණය මත admin තිදෙනෙකු හා Editor වරුන් තීරණය විය.
- ෆේස් බුක් පේජ් එකට ඇතුලත් කරන්නේ කුමන වැඩසටහන් ද හා පින්තූර කොපමණ ප්‍රමාණයක් ඇතුලත් කරන්නේද යන්න තීරණය කිරිම .

**Do**

තෝරාගත් පණිවිඩ හුවමාරු ක්‍රමය සදහා ප්‍රාදේශීය ලේකම්තුමා හා කවයේ සාමාජිකයින් විසින් එකගතාවයකට පැමිණ DS bulathsinhala නමින් අපේම නිලධාරීන්ගේ දක්ෂතා ඉස්මතු කරමින් මෙම ෆෙස් බුක් පේජ් එක නිර්මාණය විය .

**Check**

- කල වැඩසටහන් පිළිබද ප්‍රජාව දැනුවත් කිරිමට හැකි වීම .
- ඉදිරියේදි කිරිමට නියමිත වැඩ සටහන් පිළිබද දැනුවත් කිරිමට හැකිවීම .
- වැඩසටහන් වල ගුණාත්මක භාවය පිළිබද ඇගයීමක් කිරිමට හැකිවීම .
- එකවර විශාල පිරිසකට පණිවිඩ දැනුම් දීමට හැකිවීමෙන් අපදා අවස්ථා වලදී ජීවිත හා දේපල හානි අවම වීම .

- වර්තමානයේ සෑම කෙනෙකුම භාවිතා කරන නවීන ක්‍රමයක් නිසා අභ්‍යන්තර හා බාහිර පාර්ශව වෙත තොරතුරු ලබා දීමට හැකිවීම .
- නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට හැකිවීමෙන් හොද ප්‍රතිචාර ලැබීම .

**<u>ව්‍යාපෘතිය ඇගයීම</u>**

ආයතනයේ තල වැඩසහන් හා ඉදිරි වැඩසටහන් පිළිබදව අභ්‍යන්තර හා බාහිර පාර්ශව දැනුවත් කිරීමිට හැකිවීම

වැඩසටහන්වල ගුණාත්මක භාවය ආරක්ෂා වීම

බාහිර ආයතන වලින් පවා face book page එකට තොරතුරු ලැබෙමින් පැවතිම .